# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**නිකුත් කළේ** සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

**දිනය** 2022.09.15

## ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 අගෝස්තු

### 2022 අගෝස්තු මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**2022 අගෝස්තු මාසයේ දී ගැණුම් කළමණාකරුවන්ගේ දර්ශකය, දර්ශක අංක 49.6ක් වෙමින් දර්ශකයෙහි කඩඉම් මට්ටමට මදක් පහළ අගයක් වාර්තා කළ ද ජූලි මාසයට සාපේක්ෂව ඉහළ අගයක පැවතුණි.** මේ කෙරෙහි, පෙර මාසයට සාපේක්ෂව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනීම්හි වර්ධනය මෙන්ම නිෂ්පාදන සහ නව ඇණවුම් වඩා අඩු වේගයකින් පහත වැටීම ද දායක විය. තවද, රට තුළ ප්‍රවාහන කටයුතු පහසු වීම හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ද අඩු විය.

සමස්ථයක් වශයෙන්, 2022 අගෝස්තු මාසයේ දී ජූලි මාසයට සාපේක්ෂව නිෂ්පාදන සහ නව ඇණවුම් සුළු වශයෙන් අඩු විය. එසේ වුවද, විශාලතම නිෂ්පාදන උප කාණ්ඩයන් සැලකීමේ දී, රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශයේ නිෂ්පාදන සහ නව ඇණවුම් වර්ධනයක් වාර්තා කළ අතර, ආහාර හා පාන නිෂ්පාදන අංශයේ මෙම දර්ශක 2022 ජූලි මාසයේ පැවති අගයේම නොවෙනස්ව පැවතුණි. මෙය සමස්ත නිෂ්පාදන සහ නව ඇණවුම් හි පහත වැටීම සීමා වීමට හේතු විය. තවද, පෙර මාසයට සාපේක්ෂව ඉන්ධන ලබා ගැනීමේ හැකියාව ඉහළ යාම නිෂ්පාදන කටයුතුවලට හිතකර ලෙස බලපෑ බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. මේ අතර, 2022 අගෝස්තු මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව සේවා නියුක්තිය ඉහළ ගිය අතර මේ සඳහා, විශේෂයෙන්ම සේවක හිඟයෙන් නිතර පීඩාවට පත් වූ රෙදිපිළි හා ඇඟලුම් අංශයේ සේවා නියුක්තිය ඉහළ යෑම හේතු විය. තොග මිලදී ගැනීමේ වාර්තා වූ ඉහළ යෑම කෙරෙහි ඉදිරි මාසවල ආර්ථික කටයුතුවල වර්ධනයක් අපේක්ෂා කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. වෙළඳපොළේ විදේශ විනිමය ලබා ගැනීමේ හැකියාව තරමක් වැඩි දියුණු වීම භාණ්ඩ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී පහසුවක් වූ බව සමහර ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී.

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **41.4** | **49.6** | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 39.0 | 49.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 32.0 | 49.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.0 | 52.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 32.7 | 51.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 62.6 | 47.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉල්ලුම් අංශයේ බාධාවන් පැවතියද, ආර්ථික කටයුතු ක්‍රමයෙන් ස්ථාවරත්වයට පත් වීම සහ නිෂ්පාදන කටයුතු කෙරෙහි හිතකර පරිසරයක් පිළිබඳව ව්‍යාපාරිකයන්ගේ අපේක්ෂාවන් පිළිබිඹු කරමින්, ඉදිරි මාස තුන සඳහා වන නිෂ්පාදන ක්‍රියාකාරකම් පිළිබඳව අපේක්ෂා වර්ධනය විය. මෙලෙස නිෂ්පාදන අංශයේ අපේක්ෂාවන්ගේ වර්ධනයක් පෙන්නුම් කරන ලැබුවේ 2022 පෙබරවාරි මාසයෙන් පසුව ප්‍රථම වතාවටය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**49.6**

**2022 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 8.2 ක ඉහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.8කින් පහළ යමින් 2022 අගෝස්තු මාසයේ දී 50.3ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 අගෝස්තු මාසයේ දී රුසියාවේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද එක්සත් ජනපදය, ඉන්දියාව සහ සිංගප්පූරුව යන රටවල අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව අගෝස්තු මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 සැප්තැම්බර් 14 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, අඛණ්ඩව මාස හතරක් පහත වැටීමෙන් පසුව 2022 අගෝස්තු මාසයේ දී 51.7ක දර්ශක අගයක් වාර්තා කරමින් වර්ධන කලාපයට නැවත ලඟා විය.** මෙම වර්ධනය සඳහා හේතු වූයේ නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ යෑමයි.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, දේපළ වෙළඳාම, ප්‍රවාහන සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2022 ජූලි මාසයට සාපේක්ෂව 2022 අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාර වර්ධනය විය.

ඉන්ධන හිඟය පහව යෑම මධ්‍යයේ ගමනාගමනය යථා තත්ත්වයට පත්වීමත් සමඟ, අඛණ්ඩව මාස හතරක් පහත වැටුණු සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් අගෝස්තු මාසයේ දී ඉහළ ගියේය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා, දේපළ වෙළඳාම සහ රක්ෂණ යන උප අංශ ආශ්‍රිත ව්‍යාපාර ක්‍රියාකාරකම් පෙර මාසයට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළේය. එසේ වුවද, බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලද පරිදි, අනෙකුත් සැපයුම් සම්බන්ධව පවත්නා දුෂ්කරතා සමහර උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට දිගින් දිගටම අහිතකර ලෙස බලපෑවේය. මීට අමතරව, ඉහළ උද්ධමනය හේතුවෙන් ඉල්ලුම අඩු වීම ද ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි බලපා ඇත. ඒ අනුව, තොග හා සිල්ලර වෙළෙඳාම් උප අංශය ආශ්‍රිත ව්‍යාපාර ක්‍රියාකාරකම් අගෝස්තු මාසය තුළ විශාල වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කළේය.

නව බඳවාගැනීම් අත්හිටුවීම්, සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම් සහ විශ්‍රාම යෑම් වලට අමතරව සේවයෙන් ඉවත්වීම් ඉහළ යෑම හේතුවෙන් 2022 අගෝස්තු මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, කාර්ය මණ්ඩලවලට මුහුණ දීමට සිදු වූ ප්‍රවාහන දුෂ්කරතා අවම වීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් පහළ ගියේය.

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **43.0** | **51.7** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | <u>**උපදර්ශක**</u> | | |
| නව ව්‍යාපාර | 41.2 | 57.3 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 36.9 | 53.1 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 36.7 | 43.3 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 52.2 | 47.8 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 48.0 | 57.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ නව අපේක්ෂාවන් සමඟ, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2022 අගෝස්තු මාසයේ දී යථා තත්ත්වයට පත් විය. එසේ වුවද, ආනයන සීමා කිරීම්, බදු වැඩිකිරීම් සහ රට තුළ පවතින විවිධ අවිනිශ්චිතතා පිළිබඳව සමාගම් සිය කනස්සල්ල පළ කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.7**

**2022 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 8.7ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි පහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 ජූලි මාසයේ පැවති 51.1 සිට 2022 අගෝස්තු මාසයේ දී 49.2ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 අගෝස්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, ජපානය සහ ඇමරිකා එක්සත් ජනපදයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 සැප්තැම්බර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.